| | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව<br>අලෙවි කාර්යාංශය | චක්‍රලේඛ අංක<br>**1041** |
|---|---|---|

අප යොමුව : එම්කේටී/22/32(2).
2022 අප්‍රේල් මස 11 වන දින.

සියළුම සිපෙට්කෝ බෙදුම්කාර මහත්ම/මහත්මීන් වෙත,

හිතවත් සිපෙට්කෝ බෙදුම්කරුවනි,

**<u>රථවාහනවල ධාවන ටැංකිවලට හැර භාජනවලට ඉන්ධන නිකුත් කිරීම සම්බන්ධවයි.</u>**

රට තුළ ඉන්ධන බෙදාහැරීමේ කටයුතු මේ වනවිට සාමාන්‍ය පරිදි සිදුකරන බැවින් රථවාහනවල ධාවන ටැංකි (Running Tanks) වලට අමතරව පාරිභෝගිකයින් විසින් රැගෙන එනු ලබන බැරල් සහ බූලි වැනි භාජන වලට ඉන්ධන නිකුත්කිරීම පහත අනුමැතීන් යටතේ පමණක් සිදුකළ යුතුබවට මෙයින් ඔබ වෙත උපදෙස් ලබාදෙමු.

පසුගිය කාලය තුළ ඉන්ධන පිරවුම්හල් මගින් පාලනයකින් තොරව විවිධ භාජන (බැරල් සහ බූලි) වලට ඉන්ධන නිකුත්කිරීමත්, විවිධ පාර්ශවයන් විසින් එසේ ඉන්ධන තොග රැස්කර ගැනීමත් මත සාමාන්‍ය පාරිභෝගිකයාට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණයන් පිරවුම්හල් මගින් ලබාදීම සම්බන්ධයෙන් විශාල ගැටළුකාරී තත්වයකට මුහුණපෑමට සිදුවිය. මෙලෙස අවිධිමත් ලෙස ඇතැම් කණ්ඩායම් සැළසුම් සහගතව රැස්කරගත් ඉන්ධන නීතිවිරෝධී ලෙස අලෙවි කරනු ලබන බවට ද පැමිණිලි ලැබී ඇති අතර ඒ පිළිබඳව සොයාබලා නීති මගින් කටයුතු කිරීමට ශ්‍රී ලංකා පොලීසිය මේ වනවිටත් කටයුතු කරමින් සිටින බව ද මෙයින් දන්වමු.

ඉහත තත්වයන් සැළකිල්ලට ගෙන රථවාහනවල ධාවන ටැංකිවලට හැර වෙනත් භාජනවලට ඉන්ධන නිකුත්කිරීම අත්හිටුවීමට තීරණය කර ඇතිබව මෙයින් දන්වා සිටිමු.

කෙසේ වෙතත්, මෙරට නිෂ්පාදන ක්‍රියාවලියට සෘජුවම දායකවන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සැළකිල්ල යොමුකර එකී අංශවල ක්‍රියාකාරීත්වයට බාධාවක් ඇතිනොවන පරිදි එම අංශවල අවශ්‍යතා සඳහා භාජනවලට ඉන්ධන නිකුත් කිරීමේදී පහත ක්‍රමවේදයන් අනුගමනය කළයුතුබවට මෙයින් උපදෙස් ලබාදෙමු. මේ වනවිටත් ඔබ බල ප්‍රදේශයේ දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් මගින් නිෂ්පාදන, සේවා හා කර්මාන්ත හඳුනාගෙන අවශ්‍යතාවයන් මත මීට අදාළ අනුමැතීන් ලබාදීමේ වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත. ඒ අනුව බැරල් සහ බූලි වැනි භාජනවලට ඉන්ධන නිකුත්කිරීම අදාළ අනුමැතීන් මත පමණක් සිදුකල යුතුබව මෙයින් අවධාරණය කර සිටිමු.

අනුමැතිය ලබාගතයුතු ක්ෂේත්‍ර, නිළධාරීන් සහ ආයතන ;

| හඳුනාගත් ක්ෂේත්‍ර/ කර්මාන්තය | ඉන්ධන අවශ්‍යතාවය | අනුමැතිය ලබාගත යුතු නිලධාරියා/ ආයතනය |
|---|---|---|
| කෘෂිකාර්මික කටයුතු | කෘෂි උපකරණ හා යන්ත්‍ර | අදාළ බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී/ ප්‍රාදේශීය ලේකම් |
| ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ලියාපදිංචි ගිණුම් අංක සහිත පාරිභෝගික ආයතන හැර සෙසු නිෂ්පාදන, සේවා ආයතන හා කර්මාන්ත | යන්ත්‍රෝපකරණ/ විදුලි ජනක යන්ත්‍ර | අදාළ බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් |

ඉහත අනුමැතීන් මත පමණක් ඔබ ඉන්ධන පිරවුම්හල මගින් වාහනවල ධාවන ටැංකිවලට හැර වෙනත් භාජනවලට ඉන්ධන සැපයීමට අවසර ඇති අතර ඊට පටහැනිව කටයුතු කිරීම සංස්ථා අනුමත ක්‍රියාපටිපාටීන් උල්ලංඝණය කිරීමක් බව සලකන්න.

තවද ඉහත අනුමැතීන් මත නිකුත් කරනු ලබන ඉන්ධන ප්‍රමාණය සහ ආයතනය පිළිබඳ විස්තර සහිත ලේඛන පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මින් පෙර ඔබ වෙත ලබාදී ඇති උපදෙස් අනුව සිදුකළ යුතු අතර ප්‍රාදේශීය පරිපාලකවරයාගේ මාසික පරීක්ෂණ අවස්ථාවේ එම තොරතුරු ඉදිරිපත්කර එසේ නිකුත් කරනලද ඉන්ධන ප්‍රමාණයන් පිළිබඳව ලිඛිතව සනාථ කරගැනීමට කටයුතු කළයුතු බව සලකන්න.

තවද ඉන්ධනහල් මගින් ඉන්ධන බෙදාහැරීමේ ක්‍රියාවලිය විධිමත්ව සිදුවන බව අධීක්ෂණය කිරීම සඳහා බලශක්ති අමාත්‍යාංශය විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත කරඇති ඉල්ලීම අනුව සියළු දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මේ වනවිට සකස්කර ඇති වැඩපිළිවෙල සඳහා ද ඔබගේ සහයෝගය ලබාදෙන මෙන් මෙයින් වැඩිදුරටත් ඉල්ලා සිටිමු.

"මෙයට - ඔබේ සේවය සඳහා කැපවූන්"

**ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව**


**අලෙවි කළමනාකාර**

අලෙවි කාර්යාංශය,

අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,කොළඹ 09.

දුරකථන : 0115 455247/0115 234234 ෆැක්ස් : 0115 455411


සීපීඑස්/එන්එස්සේ